# වුට්ඨි සූත්‍රය

(සංයුත්ත නිකාය 1, දේවතා සංයුත්ත)

භාග්‍යවතුන් වහන්සේ දිනක් සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන සමයක එක්තරා දෙවියෙක් පැමිණ ගාථාවක් සඳහන් කළේ ය.

*'කිංසු උප්පතතං සෙට්ඨං කිංසු නිපතතං වරං,*

*කිංසු පවජමානානං කිංසු පවදතං වරන්ති.'*

මෙහි දී එම දෙවියා එම ගාථාවෙන් ප්‍රශ්න හතරක් විමසා සිටියේ ය. එනම් :-

1. ඉහළට නැගෙන දේ අතුරින් කුමක් ශ්‍රේෂ්ඨ වේ ද?
2. පහළට වැටෙන දේ අතුරින් කුමක් උතුම් වේ ද?
3. පයින් යන්නවුන් අතරින් කවරෙක් ශ්‍රේෂ්ඨ වේ ද?
4. කථාකරන්නවුන් අතරින් කවරෙක් උතුම් වේ ද?

යනු එම ප්‍රශ්නයි.

එම දෙවියා මෙලෙස ප්‍රශ්න විමසද්දී වෙනත් දෙවියෙක් ඊට පිළිතුරු වශයෙන් ගාථාවක් සඳහන් කළේ ය.

*'බීජං උප්පතතං සෙට්ඨං වුට්ඨී නිපතතං වරා,*

*ගාවො පවජමානානං පුත්තො පවදතං වරොති.'*

එහි තේරුම නම් :-

1. ඉහළට නැගෙන දේ අතුරින් බීජ (අස්වැන්න) ශ්‍රේෂ්ඨ වේ.
2. පහළට වැටෙන දේ අතුරින් වැස්ස උතුම් වේ.
3. පයින් යන්නවුන් අතුරින් ගවයා ශ්‍රේෂ්ඨ වේ.
4. කථාකරන්නවුන් අතුරින් පුතා උතුම් වේ.

මෙම දෙවියාගේ අදහස එකල භාරත ජනසමාජයෙහි මිනිසුන්ගේ ආකල්ප හා බැඳී පැවැතුණක් විය. කෘෂිකාර්මික පරිසරයක ජීවත් වූ භාරතීය ජනතාව නිතර බීජයන්ගේ ඉහළට නැගී සිටීම අපේක්ෂා කළහ. කෘෂිකර්මයෙන් ඉහළ ඵලදාවක් ලැබීම ඔවුන්ගේ සතුටට හේතුවිය. තවද කෘෂිකර්මයේ දියුණුව සඳහා වැස්ස ලැබීම ඔවුන්ගේ තවත් ප්‍රාර්ථනාවක් විය. එමනිසා වැස්ස පොළොවට පතිත වීම ඔවුහු නිතර බලාපොරොත්තු වූහ. පහළට වැටෙන දේ අතුරින් වැස්ස උතුම් බව එම දෙවියා සඳහන් කළේ මෙම අදහසෙහි පිහිටා ය. භාරතීය වැසියන් ගවයාගෙන් පස්ගෝ රස ලබන අතර ගවයා දෙවියාගේ වාහනය ලෙස සලකා ගවයාට පුද පූජා ආදිය පවා පවත්වමින් ඔවුහු ගවයා ඉමහත් භක්තියෙන් පෝෂණය කරති. ගවයා නිතර නිදහසේ හැසිර යන අතර ගවයාගේ දර්ශනය ඔවුන්ට ප්‍රිය උපදවන්නකි. පයින් ගමන් කරන්නවුන් අතරින් ගවයා උතුම් බව සඳහන් කළේ මෙම පදනමේ පිහිටායි. ඒ අතර පිරිමි දරුවකු ලැබීම දෙමාපියන්ට ආශීර්වාදයක් මෙන් ම රටේ සංවර්ධනයට උපකාරයක් ලෙස භාරතීය වැසියෝ එකල සැලකූහ. ඊට හේතුව දෙමාපියන් මිය ගිය පසු ඔවුන් වෙනුවෙන් යාගහෝම පවත්වා ඔවුන් ස්වර්ගයට යැවීමේ හැකියාව ඇත්තේ පුතුන්ට පමණක් බව ඔවුන්ගේ විශ්වාසය වීමයි. ඒ අතර කෘෂිකාර්මික දියුණුවට පුතකුගෙන් මහත් උපකාරයක් සැලසෙන බව ඔවුහු කල්පනා කළහ. මේ නිසා පිරිමි දරුවන් ලැබීම විවාහ වී සිටින්නවුන්ගේ ප්‍රධාන අපේක්ෂාවකි. එබැවින් පුතකුගේ කටහඬ පවා ඔවුන්ගේ සතුටට හේතුවක් විය. කථා කරන්නවුන් අතර පුතා උතුම් බව දක්වා ඇත්තේ එබැවිනි. එම දෙවියා තමාගේ අදහස දැක්වූ පසු භාග්‍යවතුන් වහන්සේ වඩා පුළුල් පදනමක පිහිටා ඉහත ප්‍රශ්නවලට පිළිතුරු ඉදිරිපත් කළහ.

මෙහි දී බුදුරජාණන් වහන්සේ එම දෙවියාගේ ප්‍රශ්නවලට මෙලෙස පිළිතුරු ගාථාවක් සඳහන් කළහ.

*විජ්ජා උප්පතතං සෙට්ඨා අවිජ්ජා නිපතතං වරා,*

*සංඝො පවජමානානං බුද්ධෝ පවදතං වරොති.*

1. ඉහළට නැගෙන දේ අතුරින් විද්‍යාව හෙවත් ප්‍රඥාව ශ්‍රේෂ්ඨ වේ.
2. පහළට වැටෙන දේ අතුරින් අවිද්‍යාව හෙවත් මෝහය උතුම් වේ.
3. පයින් යන්නවුන් අතුරින් සංඝ රත්නය ශ්‍රේෂ්ඨ වේ.
4. කථාකරන්නවුන් අතුරින් බුදුරජාණන් වහන්සේ උතුම් ය.

ඉහළට නැඟෙන හෙවත් දියුණු වන දෑ අතුරින් කුමක් ශ්‍රේෂ්ඨ දැයි දෙවියා විමසූ පැනයට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ විද්‍යාව හෙවත් ප්‍රඥාවේ නැගී සිටීම ශ්‍රේෂ්ඨ බවයි. පහළට වැටෙන හෙවත් වැය (ක්ෂය) වන දෑ අතුරින් උතුම් ම දෙය වශයෙන් දක්වන්නේ අවිද්‍යාවයි. තවද පයින් ගමන් කරන්නවුන් අතර සංඝයා ශ්‍රේෂ්ඨ බවත් කථාකරන්නවුන් අතර බුදුරජාණන් වහන්සේ උතුම් බවත් සඳහන් කරති.

## විද්‍යාව හෙවත් ප්‍රඥාව

බුදුරජාණන් වහන්සේ දේශනා කළ සද්ධර්මය ශ්‍රවණය කළ පමණට මොහ'ඳුර දුරු වී සසර පිළිබඳ අපගේ අවබෝධය ක්‍රමයෙන් දියුණු වේ. ඒ අනුව අනන්ත සසරෙහි අප විඳි දුක් රැසෙහි සීමාවක් නැති බව පෙනී යයි. හුදෙක් මිනිස් ලොව පමණක් නොව සතර අපායන්හි වැටී කල්ප ගණන් අප දුක් ගැහැට විඳ තිබේ. අපේ දෙමාපියන් ඥාතිමිත්‍රාදීන් මිය ගිය අවස්ථාවන්හි හැඬූ කඳුළු එක් කළහොත් මහසයුරෙහි ජලයට වඩා අධික ය. තිරිසන් ගත ව ඉපිද සිටි අවස්ථාවන්හි බෙලි කැපුම් කෑ අවස්ථාවන්හි ගලාගිය ලේ එක් කළ හොත් මහ සයුරෙහි ජලයට වඩා අධික ය. එබඳු අතීත භවයන් ගතකොට ඇති අප මේ ජීවත් වන්නේ අතිශය භාග්‍ය සම්පන්න දුර්ලභ අවස්ථාවකයි. එනම් බුදුවරයකුගේ දහමක් ලොව පවතින අවස්ථාවක පරිපූර්ණ මිනිස් ජීවිතයක් සහිතව උපත ලබා තිබීමයි. මෙබඳු දුර්ලභ අවස්ථාවක් ලද විටෙක අප කළ යුතු උතුම් ම කාර්යය වන්නේ බුදුරදුන් වදාළ ධර්මය ශ්‍රවණය කොට හැකිතාක් දුරට අපගේ ප්‍රඥාව දියුණු කරගෙන දුකින් නිදහස්වීම සඳහා ක්‍රියා කිරීමයි. අද අප ලබා ඇති මේ භාග්‍ය සම්පන්න සුබ මොහොත (ක්ෂණ සම්පත්තිය) මැනැවින් තේරුම් ගෙන බුද්ධිමත්ව සද්ධර්මයෙන් එල නෙළා ගැනීමට සමත් වුවහොත් දුගතියෙන් ස්ථිරව අත්මිදීමට මෙන් ම සසර දුකින් සදහට ම නිදහස්වීමට ද අවස්ථාව සැලසෙනු ඇත.

පුරා වසර 45ක් පුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ හැම දහම් පදයකින් ම අපේක්ෂා කළේ ලෝක සත්ත්වයන්ට ප්‍රඥාලෝකය ඇතිකරලීමයි, නුවණැස ලබාදීමයි. උන්වහන්සේ දේශනා කළ පළමු ධර්ම දේශනයේ දී තමන් වහන්සේ ලද ප්‍රඥාලෝකය පැහැදිලි කළහ. ***චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලෝකෝ උදපාදි...*** ආදි වශයෙන් විස්තර කර ඇති පරිදි උන්වහන්සේ ලද ප්‍රඥාව ලෝවැසියන් වෙත ම පතුරුවාලූහ. එම ධර්මය මැනැවින් ශ්‍රවණය කොට නුවණැස ලද පමණට තමා හා අවට ලෝකය පිළිබඳ අවබෝධය ලැබී සන්තානගත කෙලෙස්වලින් මිදීමට අවකාශ සැලසෙන අතර එපමණට සිත්හි පවත්නා දුක් කම්කටොලුවලින් නිදහස්වීමටත් අපා දුකින් මිදීමටත් අවස්ථාව උදාවේ. යම් විටෙක අප දුකින් අසහනයෙන් අසතුටෙන් සිටී නම් ඊට හේතුව කෙලෙසුන්ගෙන් සිත කිලිටි වී තිබීමයි. සිතෙහි ඇති දුක් දුරුකොට සිතෙහි සහනය සතුට සැනසුම දියුණු කර ගත හැකි මාර්ය වන්නේ එම කෙලෙසුන්ගෙන් සිත මුදවාලීමයි. මෙහිදී සිතට දුක ගෙන දෙන හේතු තේරුම් ගැනීම ද බෙහෙවින් වැදගත් වේ. සිතට අසහනය දුක වේදනාව ඇතිවීමට බලපාන ප්‍රධාන කෙලෙස් තුනකි.

*'තීණි'මානි භික්ඛවේ අකුසලමූලානි, කතමානි තීණි? ලෝභෝ අකුසලමූලං, දෝසෝ අකුසලමූලං, මෝහෝ අකුසලමූලං. ඉමානි ඛෝ භික්ඛවේ තීණි අකුසලමූලානි.*

යනුවෙන් දැක්වෙන පරිදි සිත අපිරිසිදුවීමට බලපාන ප්‍රධාන අකුසල මූල තුනක් ඇත. එනම් ලෝභ, ද්වේෂ හා මෝහයි.

අප බොහෝ විට සතුරන් ලෙස සලකන්නේ බාහිර ලෝකයේ සිට තමාට පීඩා ගෙන දෙන සත්වයන්ටයි. එහෙත් බුදුදහමේ දැක්වෙන පරිදි සැබෑ සතුරන් වන්නේ අවිද්‍යාව නිසා තම චිත්ත සන්තානයේ ජනිත ව තමාගේ සිතෙහි සතුට පැහැර ගන්නා ලෝභාදි අකුසල මූලයන්ටයි. මෙම අකුසල මූල තුන පුරුෂයාගේ යහපත නසාලන බව දක්වා තිබේ. උණ ගස්හි මල් හටගැනීමෙන් එම ගස නැසී යන්නාක් මෙනි.

*'ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,*

*හිංසන්ති අත්තසම්භූතං තචසාරං'ච සම්ඵලං.'* (අකුසලමූල සුත්ත, ඉතිවු. 378)

යුද බිමෙහි දහස්ගණන් සතුරන් පරාජය කිරීමට වඩා තම සන්තාගත ලෝභ, ද්වේෂ, මෝහ පරාජය කොට තම සිත ජයගැනීම වඩා උතුම් බව භාග්‍යවතුන් වහන්සේ දේශනා කරති.

*'යො සහස්සං සහස්සෙන සංගාමෙ මානුසෙ ජිනෙ,*

*එකං ච ජෙය්‍ය අත්තානං සවෙ සංගාමජුත්තමො' (ධම්මපද)*

ලෝභ යනු ඇස්, කන් ආදි ඉන්ද්‍රියයන්ට ලක්වන රූප, ශබ්දාදි ප්‍රිය අරමුණු පිළිබඳව අනුවණින් මෙනෙහි කිරීම නිසා සිතෙහි හටගන්නා බැඳීම හෙවත් ඇලීමයි. ද්වේෂ යනු ඇස්, කන් ආදි ඉන්ද්‍රියවලට ගෝචර වන රූප, ශබ්දාදි අප්‍රිය අරමුණු පිළිබඳව අනුවණින් මෙනෙහි කිරීමෙන් සිතෙහි හටගන්නා ගැටීමයි, විරසක බවයි. තම ජීවිත පැවැත්ම පිළිබඳ ඇති දැඩි ආශාව හෙවත් නන්දිරාගය ඇති විට ඊට අභියෝග වන දෑ සිදුවන විට සිතෙහි ගැටීම ද්වේෂය හටගනී. මෝහ හෙවත් අවිද්‍යාව යනු යමක පවත්නා යථා ස්වභාවය නොදන්නා නිසා ඇතිවන මුළාවයි. සිත අතරමං කරලන මානසික ස්වභාවයයි. අන්ධකාර කාමරයක අතරමං ව ඇති විට තමා අතින් බොහෝ අඩුපාඩු වැරදීම් සිදුවන්නාක් මෙන් මෝහයෙන් අන්ධකාරව ඇති විට බොහෝ අනුවණ ක්‍රියා අප අතින් සිදු වේ. ලෝභ, ද්වේෂ හට ගන්නේ මෝහය හෙවත් අවිද්‍යාව තිබූ පමණටයි. එබැවින් ලෝභාදී අකුසල මූලයන් අතුරින් අවිද්‍යාව ප්‍රබලතම කලේශය හෙවත් මලය වශයෙන් භාග්‍යවතුන් වහන්සේ දක්වා තිබේ.

ප්‍රඥාවෙහි වැදගත්කම :-

ලෝභාදී අකුසල මූලයන් සම්පූර්ණයෙන් දුරු කිරීමටත් දුකින් නිදහස්වීමටත් අවශ්‍ය කරන ප්‍රධානතම සාධකය වශයෙන් බුදුදහමින් අනාවරණය කර ඇත්තේ ප්‍රඥාව හෙවත් නුවණ උපදවා ගැනීමයි. එනම් ලොව ඇති තතු යථා පරිදි අවබෝධ කර ගැනීමයි. ප්‍රඥාව ලැබූ පමණට මේ ජීවිතයෙහි දී ම දුකින් නිදහස් වීමට අවකාශ සැලසේ. එමනිසා ප්‍රඥාව මිනිසාට ඇති උතුම් ම රත්නය (*පඤ්ඤා නරානං රතනං*) වශයෙන් දක්වා තිබේ. ප්‍රඥාව සමාන ආලෝකයන් නැති බව සඳහන් වේ (*නත්ථි පඤ්ඤා සමා ආභා*). ප්‍රඥාවෙන් පාරිශුද්ධත්වය ලැබේ (පඤ්ඤාය පරිසුජ්ඣති). ප්‍රඥාව චරිතයෙන් සෝභමාන වේ (*අපදාන සෝභිනී පඤ්ඤා*). එම ප්‍රඥාවේ නැඟී සිටීම ශ්‍රේෂ්ඨ (*විජ්ජා උප්පතතං සෙට්ඨා*) බවත් ප්‍රකාශ වේ. එබැවින් ප්‍රඥාව සම්පත්තියක් (*පඤ්ඤා සම්පදා*) වශයෙන් ද එය ධනයක් (*පඤ්ඤා .... ධනං*) වශයෙන් ද සැලකේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ආරම්භයෙහි දැක්වෙන සම්මාදිට්ඨි නමින් දැක්වෙන්නේ ද මෙම ප්‍රඥාවයි. සද්ධර්මශ්‍රවණය හා යෝනිසෝමනසිකාරය ඔස්සේ එය නිවන දක්වා ම වර්ධනය කර ගත යුතු ගුණාංගයකි.

ප්‍රඥාව වැඩීමට හේතුවන කරුණු :

බුදුරදුන් වදාළ සද්ධර්මය ඔස්සේ අවබෝධය ලද පමණට නුවණැස හෙවත් ප්‍රඥාව දියුණු වී සිතෙහි සතුට පිවිතුරුබව පැහැර ගන්නා ලෝභ, දෝස, මෝහ යන කෙලෙසුන්ගෙන් සිත මුදවාලීමට අවස්ථාව සැලසේ. යමකු කෙතෙක් දුරට ප්‍රඥාවන්තදැයි බාහිරින් පරීක්ෂාකර බැලිය හැක්කේ ඔහු හා සාකච්ඡා කිරීමෙනි (සාකච්ඡාය පඤ්ඤා වේදිතබ්බෝ). ප්‍රඥාව ලැබීම සඳහා හේතුවන කරුණු හතරක් පිළිබඳව ධර්මයෙහි සඳහන් වේ. එනම්,

1. කල්‍යාණමිත්‍ර ආශ්‍රය
2. සද්ධර්මශ්‍රවණය
3. යෝනිසෝ මනසිකාරය
4. ධර්මානුධර්ම ප්‍රතිපදාව

ලොව ඇති තතු යථා පරිදි අවබෝධ කරලන සත්පුරුෂයන්ගේ ඇසුර 'කල්‍යාණමිත්‍ර ආශ්‍රය' නම් වේ. එම කල්‍යාණ මිත්‍රයන් වෙතින් ලැබෙන උසස් ම ලාභය නම් 'ධර්මශ්‍රවණයයි'. එනම් ලෝකය හා තමා පිළිබඳ ඇත්ත ඇති සැටියෙන් පහදාලන තථාගත අනුශාසනයයි. කර්මය හා කර්මඵල පිළිබඳවත් පටිච්චසමුප්පාදය පදනම් කොටගත් අනිත්‍යතාව පිළිබඳවත් මෙහි දී අවබෝධය ලැබේ. එලෙස ඇසූ දහම ඔස්සේ තම සිතට කෙලෙස් නොනැඟෙන පරිදි චින්තනය මෙහෙයවීම එනම් නුවණින් එම දහම සිහි කිරීම 'යෝනිසෝ මනසිකාරයයි'. හැම මොහොතක ම සිදුවන ස්කන්ධ පංචකයේ ඇතිවීම (සමුදය) හා නිරුද්ධවීම (වය) නුවණින් මෙනෙහි කිරීම මින් අදහස් කෙරේ. තවද ඇසූ දහම අනුව සීලයක පිහිටා තම සිහිය (සති) හා නුවණ (පඤ්ඤා) දියුණු කිරීම 'ධර්මානුධර්ම ප්‍රතිපදාවයි'. මෙම කරුණු හතර ධර්ම මාර්ගය ආරම්භයේ පටන් සෑම ආධ්‍යාත්මික ස්තරයක ම සිටින අය විසින් අඛණ්ඩව දියුණු කළ යුතු බව සඳහන් වේ. මෙම කරුණු හතරින් උපකාර ලැබූ පමණට තම නුවණ දියුණු වී කෙලෙසුන්ගෙන් සිත මුදවාගැනීමට අවස්ථාව සැලසේ. සිත කෙලෙසුන්ගෙන් මුදවාලීමට උපකාරී වන ප්‍රධානතම කරුණු වශයෙන් බුදුදහමින් අවධාරණය කරන්නේ ප්‍රඥාව උපදවා ගැනීමයි. එනිසා ප්‍රඥාවේ වැදගත්කම පිළිබඳව බුදුරජාණන් වහන්සේ නිතර දේශනා කර තිබෙනු දක්නට ලැබේ.

විද්‍යාව හෙවත් ප්‍රඥාවෙහි ප්‍රධානතම ලක්ෂණය නම් උදකප්‍රසාද මාණික්‍යයක් මෙන් දුකෙහි හටගැනීම හා නිරෝධය පිළිබඳ අවබෝධය ලබාදීමයි. බොර වී ඇති අපිරිසිදු ජලාශයක පතුලෙහි ඇති දෑ පැහැදිලිව නොපෙනේ. එහෙත් වතුර පිරිසිදු වන දෙයක් හේතුවෙන් මගින් එය පිරිසිදු වී ඇති විට පතුලෙහි ඇති දෑ පැහැදිලි දැක ගත හැක. එමෙන් ම ශ්‍රැතමය ඥානයෙන් ධර්මය අසා සිත සමාධිමත් කොට එය නුවණින් මෙනෙහි කරන පමණට මානසික දුක් පීඩා ඇතිවීමට බලපාන අවිද්‍යාව ක්‍රමයෙහි පහව ගොස් අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය මැනැවින් ප්‍රකට වේ.

ඇසට රූපාලම්බනයක් පතිත වන විට චක්ෂු ප්‍රසාදය බිඳී ගොස් ඒ අරබයා සඤ්ඤා, වේදනා හටගනී. රූපයට අදාළ එම සඤ්ඤා වේදනා ධර්මාලම්බන වශයෙන් මනින්ද්‍රියෙන් අරමුණු කිරීම් වශයෙන් කිසියම් රූපයක් මනසින් හඳුනා ගනී. එලෙස හඳුනා ගන්නා විට මුලින් චක්ෂු විඤ්ඤාණයෙන් ගත් අරමුණු වැය වී ගොසිනි. ඒ අනුව රූපයක් හඳුනා ගන්නා විට පියවර කිහිපයක් පසු කර තිබෙන අතර අප අරමුණ හඳුනා ගන්නේ අතීත රූපයක් පිළිබඳවයි. කණ, නාසය, දිව, කය යන සෙසු ආයතනයන්ට ලක්වන ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ යන සෙසු අරමුණු පිළිබඳව ද යථාර්ථය මෙයයි. මෙම ඇස, කන ආදි ඉන්ද්‍රිය මෙන් ම රූප, ශබ්දාදි අරමුණුවල ද ස්වභාවය නම් ඒවා පෙර නොතිබී වර්තමාන හේතු ඇති විට හටගෙන අනාගත අරමුණට කිසියම් බලපෑමක් කරමින් වර්තමානයෙහි ම ඉතිරි නැති ව නිරුද්ධ වීමයි (අහුත්වා සම්භූතං හුත්වා න භවිස්සති). මෙම යථාර්ථය යමෙක් නුවණින් විද්‍යා සහගතව දකියි ද එපමණට දුක්ඛ ආර්ය සත්‍යය තේරුම් ගත්තේ වෙයි. ඒ සමග ඔහු දුක්ඛ සමුදාර්ය සත්‍යය වූ තෘෂ්ණාව දුරු කිරීම් වශයෙන් කිසිදු බාහිර රූපාදි අරමුණකට නොබැඳෙයි. ඇස ආදි අභ්‍යන්තර ඉන්ද්‍රිය කෙරෙහි ද ඇල්මක් ඇති කර නොගනියි. අභ්‍යන්තර සිතෙහි ද ඇතිවීම් නැතිවීම් සංඛ්‍යාත නිරෝධය දැකීම් වශයෙන් ඊට ද නොඇලෙයි. ඒ අතර ආර්ය අෂ්ටාංගික මර්ගය නම් වූ දුක්ඛ නිරෝධගාමිනී පටිපදාව වැඩීම තුළින් ඇතිවීම් නැතිවීම් සංඛ්‍යාත අනිත්‍යතාව මැනැවින් ප්‍රත්‍යක්ෂ කිරීම් වශයෙන් ප්‍රඥාවෙන් සිටින විට ඔහු අතීත අනාගත අන්තවලින් මෙන් ම අභ්‍යන්තර බාහිර අරමුණුවලින් ද නිදහස්ව සියලු දුක්වලින් මිදීමට පත් වේ. එනම් දුක්ඛ නිරෝධාර්ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන්නේ වෙයි.

විද්‍යාව හෙවත් ප්‍රඥාව ඉහළ ම තලයට දියුණු කළ විට ඇස, කන ආදි අභ්‍යන්තර ආයතනත් රූප, ශබ්දාදි බාහිර ආයතනත්, රූපාදි ස්කන්ධ පංචකයත්, චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු ආදි ධාතූත්, නාමරූප විඤ්ඤාණත් ආදි වශයෙන් සත්ත්ව ජීවිතය සම්බන්ධ සියලු ප්‍රඥප්තීන්හි පෙර නොතිබී හටගෙන නිරුද්ධ වන අවබෝධයෙහි තම සිහිය හා නුවණ සම්පූර්ණයෙන් පවතී. ඒ සමඟ ම යමක් දුටු විය එය දැකීම් මාත්‍රයක් පමණක් බව (*දිට්ඨෙ දිට්ඨමත්තං*) ද, යමක් ඇසූ විට එය ඇසීම් මාත්‍රයක් පමණක් බව (*සුතෙ සුතමත්තං*) ද, යමක් නාසය දිව කය යන ඉඳුරන්ගෙන් විඳ ගත්තේ ද එය විඳි ගැනීම් පමණක් බව (*මුතෙ මුතමත්තං*) ද, යමක් සිතින් දැන ගත්තේ ද එය දැනගැනීම් මාත්‍රයක් බව (*විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං*) ද යන අවබෝධයෙහි නිරතුරුව තම නුවණ පවත්වා ගැනීමට අවස්ථාව උදාවේ. මෙය තමා දුකින් සපුරා නිදහස් වූ බව පිළිබඳ සලකුණකි. දුර්ලභව ලද මේ උතුම් බුද්ධෝත්පාදයෙන් හා වටිනා මිනිස් භවයෙන් අප ලබා ගන්නා ඉහළ ම ප්‍රතිඵලය මෙයයි. එබැවින් විද්‍යාවේ නැඟී සිටීම ශ්‍රේෂ්ඨ බව මෙහිදී බුදුරජාණන් වහන්සේ දේශනා කරති.

## අවිද්‍යාව හෙවත් මෝහය

අවිද්‍යාව යනු තම ජීවිතයට සිදුවන සැබෑ ස්වභාවය නොදන්නා බවයි. එනම් දුකත් දුකට හේතුවත් දුක නැති කිරීමත් ඊට මාවතත් නිවැරදි නොදන්නා බවයි. ඇසට රූපයක් ගෝචර වන විට අපට සිතෙන්නේ දැන් පෙනෙන රූප එලෙසින් ම සජීවී ලෙස තමාට පෙනෙන බවයි. එලෙස සිතෙන විට බාහිර රූපය මම ය, මාගේ ය, මාගේ ආත්මය ය වශයෙන් කරයි. එවිට බාහිර රූපයෙහි සිත බැස ගනී. බාහිර රූප, ශබ්දාදියෙහි සිත බැස ගග හොත් ජරා, මරණාදි දුකින් නිදහස්වීමක් නැත. බාහිර රූපයක් ඇසට ස්පර්ශ වීමේදී සිදුවන්නේ එම අරමුණ පිළිබඳව චක්ෂු ප්‍රසාදය බිඳී ඒ පිළිබඳව සඤ්ඤා වේදනා හට ගැනීමයි. සඤ්ඤා වේදනා හට ගන්නේ ඇස හා රූපය වැය වීමේ ප්‍රතිඵලයක් වශයෙනි. පසුව එම සඤ්ඤා වේදනා අරභයා මනායතනයෙන් මෙනෙහි කිරීම් වශයෙන් රූපය හඳුනා ගෙන ඒ අනුව චේතනා පහළ කර ගනී. ඒ සමග ම රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන ස්කන්ධ පංචකයක් පෙර නොතිබී හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වේ. අප ජීවත් වෙනවා යනු ඇස, කන, නාසය, දිව, කය, මනස යන ආයතන ඔස්සේ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම යන අරමුණු නිතර ස්පර්ශ වීම් වශයෙන් නිරතුරුව ස්කන්ධ පංචකයක් සකස් වීමයි. මේ බව නොදන්නා බව නිසා බාහිර රූපයක් ඇතැයි නිත්‍ය, සැප, ආත්ම වශයෙන් ගන්නා අතර එමගින් ජරාමරණාදි අනන්ත දුක් විඳීමට සිදු වේ. භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ මෙම අවිද්‍යාවේ පහළ වැටීම හෙවත් දුරුවීම පහළට වැටෙන දෑ අතුරින් උතුම් ම දේ බවයි.

## සංඝ රත්නය

සංඝ රත්නය යනු බුදුරජාණන් වහන්සේ, ධර්මය හා ආර්ය සංඝයා කෙරෙහි ප්‍රසාදය උපදවා ගෙන සම්බුදු සසුනෙහි පිරිවෙත් පුරා කෙලෙසුන්ගෙන් නිදහස්වීමේ සත්ප්‍රාර්ථනාවෙන් ගිහි සම්පත් අතැර පැවිදි වූ උතුමන් ය. අර්හත් ධජය වූ චීවරය දරමින් උන්වහන්සේලා තමාගේ ආත්ම විමුක්තිය සඳහා කටයුතු කර ගන්නා අතර ලෝක සත්ත්වයන් කෙරෙහි ද ඉමහත් කරුණාවෙන් ක්‍රියා කරමින් ධර්මදේශනා කරමින් ලොවට පින් කෙතක් වෙමින් හැසිරෙයි. ඒ අතර දුර්ලභ වූ අනර්ඝ බුද්ධවචනය පරපුරෙන් පරපුරට දායාද කරනු වස් මහත් පරිශ්‍රමයෙන් ද කටයුතු කරයි. භාග්‍යවතුන් වහන්සේ ජීවමාන කාලයෙහිත් ඉන් පසු වසර දෙදහස් පන්සියයකට අධිකකාලයක් පුරාත් සංඝ රත්නය ගම්දනව් පුරා වඩිමින් ලොවට ඉමහත් සේවාවක් කළහ. භාරතයේ සිට ලොවපුරා බුදුසසුන ව්‍යාප්ත කොට එය ස්ථාපිත කරමින් ලෝවැසියන්ගේ නෙතට සිත් සිත් පහන් කරමින් භික්ෂූන් වහන්සේලා මේ මිහිමත සිව්දෙස වඩිමින් සිටිති. උන්වහන්සේලාගේ දැකීම් මාත්‍රය පවා ලොවට ශාන්තියකි. උන්වහන්සේලාට දන් හැන්දක් වුව ද පූජා කිරීම සුගතිගාමී වීමට හේතුවකි. මහාකාශ්‍යප මහරහතන් වහන්සේ වැනි උතුමන් ක්‍රියා කළ ආකාරය මීට හොඳම නිදසුන් ය. මෙබඳු තත්ත්වයක් මත භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ පයින් ඇවිද යන්නවුන් අතර සංඝ රත්නය උතුම් බවයි.

## බුදුරජාණන් වහන්සේ

සම්බුදුපියාණන් වහන්සේ එදා සම්බුද්ධත්වයට පත්වීමේදී අවබෝධ කළ ශ්‍රී සද්ධර්මය වසර 45ක් පුරා ලොවට දම් දෙසමින් දුකින් නිදහස් වන මාවත ලෝවැසියන්ට ඉමහත් කරුණාවෙන් පහදා දුන්හ. එම දේශනය තුළ කිසිදු අසත්‍ය වචනයක් හිස් වචනයක් ඵරුෂ වචනයක් හිස් ප්‍රලාපයක් නොමැත. හැම දහම් පදයක් ම සත්‍යය, කරුණාව, යථාවබෝධය හා මිශ්‍රව පවතී. භාග්‍යවතුන් වහන්සේගේ නිකෙලෙස් හද මඩලේ ජනිතව ශ්‍රී දළදා වහන්සේගේ පහස ලබා මහාප්‍රඥාවෙන් හා මහාකරුණාවෙන් යුතුව ලොවට දෙසූ දහමින් අපමණ දෙව් මිනිස්සු නිවී සැනසීමට පත්වූහ. කථා කරන්නවුන් අතර බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන්නේ එබැවිනි.

ඔබ සැමට තෙරුවන් සරණයි !

බු.ව. 2561 ඉල් පුන් පෝදා

රිවර්සයිඩ් මොරිනෝ වැලිහි සම්බුද්ධාලෝක බෞද්ධ විහාරස්ථානයේ

**සීල සමාදානය**

(11/04/2017)